# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2310/71 - 2022 දෙසැම්බර් මස 17 වැනි සෙනසුරාදා - 2022.12.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ වැලිගම ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

අවසර නොලබා මාස 03 ක කාලසීමාවක් සභා රැස්වීම්වලට සහභාගී නොවීම හේතුකොට ගෙන වැලිගම ප්‍රාදේශීය සභාවේ සභික ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ වැලිගම ප්‍රාදේශීය සභාවේ අංක. 25 තල්අරඹ කොට්ඨාසයට තේරී පත් වූ වින්දික ඉපලවත්ත අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරාපත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම වැලිගම ප්‍රාදේශීය සභාවේ අංක. 25 - තල්අරඹ කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සාලිය නානායක්කාර නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

වැලිගම ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, තානාන්තිරි විතානගේ පෝෂිතා කෞමදී වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් සාලිය නානායක්කාර, වැලිගම ප්‍රාදේශීය සභාවේ අංක 25 - තල්අරඹ කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරාපත් කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**තානාන්තිරි විතානගේ පෝෂිතා කෞමදී,**
තේරීම්භාර නිලධාරි,
වැලිගම ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 16 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මාතර.

EOG 12 - 0233

1A - G 38374 — 16 (2022/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*